# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,493 — 2007 අප්‍රේල් 12 වැනි බ්‍රහස්පතින්දා — 2007.04.12

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ජේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | 292 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 306 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අප්‍රේල් මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 05 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් වි භාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට වි භාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවි ය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## සංශෝධනය

### දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා වෛද්‍ය සේවයට බඳවා ගැනීම

ඉහත තනතුරු සම්බන්ධයෙන් 2007.03.23 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I : II (අ) ඡේදය යටතේ පළවූ දැන්වීමේ දක්වා ඇති අයදුම් පත්‍රයේ ප්‍රමාණය 13″x 18″ වශයෙන් මුද්‍රණය වී ඇත. එය 13″x 8″ වශයෙන් සංශෝධනය විය යුතු වේ.

අසෝක මාලිමගේ,
ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2007 මාර්තු මස 26 වැනි දින,

04 – 246

---

## ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව

### ගුවන් භටයින් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත දැක්වෙන වෘත්තීන්වල ගුවන් භටයින් සඳහා පුරප්පාඩු පවතී.

01. (අ) *වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*
(1) *යන්ත්‍රාගාර ක්‍රියාකරු :*
*විදුලි වැඩකරු :*
*වායු සමීකරණ හා ශීතකරණ ශිල්පි :*
*යන්ත්‍ර වැද්දුම්කරු :*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් ඇතුළුව ගණිතය, විද්‍යාව (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(*ආ*) *අනෙකුත් සුදුසුකම් :*

ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි :

(1) පුරවැසි භාවය : - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
(2) වයස : 2007 ජුනි මස 30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වූ ද අවුරුදු 30 ට නොවැඩි අයෙකු විය යුතුයි.
(3) උස : අඩි 5 අඟල් 5 කට නොඅඩු විය යුතුයි.
(4) බර : - ශරීර ස්කන්ධ දර්ශකය $\frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2} < 25$
(5) පපුව : අඟල් 32 කට නොඅඩු විය යුතුයි.
(6) වර්ණ දෘෂ්ටිය : CP 2
(7) දෘෂ්ඨි තීක්ෂණත්වය : - වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)
(8) සිවිල් තත්ත්වය:- විවාහක/අවිවාහක යන දෙපාර්ශවයටම අයදුම් කල හැකිය. අවිවාහක අයදුම්කරුවන් ගුවන් හමුදාවට බැඳී වසර එකක් ගතවන තුරු විවාහක වීමට අවසර නොලැබේ.

02. පළමුවන ඡේදයේ “ආ” හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ පළමුවන ඡේදයේ “ආ” හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ගනු නොලබන අයදුම්කරුවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව වයස, උස හා අධ්‍යාපන සුදුසුකම් නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

03. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. *සේවා කොන්දේසි* :

(අ) ගුවන් හටයින් සේවයට බැඳුනු දා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(ආ) තෝරාගනු ලබන සියලුම වෘත්තීන්වල අදාළ ගුවන් හටයින්ට මූලික සටන් පුහුණුවත් ඉන් පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්වයන්හි වුව ද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකළ යුතුය.

05. *බඳවා ගැනීමේ කොන්දේසි* :

(අ) තෝරාගනු ලබන අපේක්ෂකයින් ස්වේච්ඡා ගුවන් හමුදාවේ (තුන්වන පන්තියේ) ගුවන් හට ශ්‍රේණියට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් අඛණ්ඩව වසර 05 ක් ගුවන් හමුදාවේ සේවය කළ යුතු වේ. ඒ බවට එකඟ වන ගිවිසුමකට ඔවුන් අත්සන් කළ යුතුයි. අවුරුදු 05 ක සේවය අවසන් වූ පසුව තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් හටයින්ට අවස්ථාව ඇත.

06. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්* .- තෝරා ගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

07. *වැටුප් හා දීමනා* :

(අ) වසරකට ගුවන් හටයින්ට අදාළ, ඒකාබද්ධ වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ.

ගුවන් හට – රු. 1,66,560-7x1,440-10x1,800 = රු. 1,94,640

නායක ගුවන් හට – රු. 1,70,880-4x1,440-11x1,800 = රු. 1,96,440

කෝප්‍රල් – රු. 1,75,200-1x1,440-13x1,800 = රු. 2,00,040

සැරයන් – රු. 1,78,440-10x1,800-2x2,520 -1x3,480 = රු. 2,04,960

බලපන්ති සැරයන් – රු. 1,82,040-8x1,800-2x2,520 - 3 x 3,480 = 2,11,920

බලලත් නිලධාරි – රු. 1,89,240-4x1,800-2x2,520 - 9x3,480 = 2,32,800

ඉහත දැක්වෙන පරිදි වාර්ෂික ඒකාබද්ද වැටුප් පරිමානයන්ට අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. සේවා කාලය, යහපත් කල්ක්‍රියාව සහ කාර්යක්ෂමතාව මත ඉදිරි නිලයන් පිරිනමනු ලබන අතර ඒ අනුව නියමිත වැටුප් දර්ශකයන්හි පිහිටවනු ලැබේ.

(ආ) *දීමනා* :

(1) *ජීවනාධාර දීමනාව.*— මසකට රු. 1,750 ක් ගෙවනු ලැබේ.
(2) *දුෂ්කර දීමනා.*- මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.
(3) ක්‍රියාත්විත සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 1,900ක් ගෙවනු ලැබේ.
(4) *විශේෂ දීමනාව.*— මසකට රු. 2,400 ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 80 බැගින්)
(5) *ආහාර දීමනා.*— පිටත වාසය කරන ගුවන් හටයින්ට මසකට රු. 5,649.75 බැගින් ගෙවනු ලබන අතර කඳවුරු තුළ වාසය කරන ගුවන් හටයින්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.
(6) *නේවාසික පහසුකම්.*— කඳවුරු තුළ වාසය කරන ගුවන් හටයින්ට නොමිලේ සපයනු ලැබේ.
(7) *ගමනාගමනය.*— වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් හටයා/භාර්යාව/ළමයින්ට) ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් හටයින්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.
(8) *වික්ෂේපණ දීමනා.*— මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)
(9) *යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා.*— මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ටය. (මසකට රු. 30 සිට රු. 204 දක්වා)
(10) *නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.*— මසකට රු. 170 ක් ගෙවනු ලැබේ.
(11) වෛද්‍ය පහසුකම්.— ගුවන් හමුදාව මගින් සෑම හටයෙකුටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඔහුගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.
(12) කඳවුරුවල සිට සැතපුම් 30 ක (කි. මී. 48ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් හටයින් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.
(13) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන් හටයින්ට මසකට රු. 1,200 සිට රු. 3,300 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.
(14) වෙනත් දීමනා.— (වෙන්ව සිටීමේ හා විදේශගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.
(15) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ.

08. *ඉල්ලුම්කරුට උපදෙස්* :

*(අ)* පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව තම අත් අකුරින් සකස් කරන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2007 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00 ට පෙර ලැබෙන සේ "ආධුනිකයින් බඳවාගැනීමේ නිළධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකළ, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපැලෙන් එවනු නොලබන ඉල්ලුම්පත් බාර ගනු නොලැබේ.) අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් හටයින් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම්කළ යුතු අතර වෘත්තීන් කීපයකට ඉදිරිපත් කරනු ලබනු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකල, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර වෙත ලැබුණා වූ ද මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ද ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

(*ආ*) රජයේ සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/ සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතුයි.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයින් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි :

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.) ;
(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික;
(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව සහ හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික ;
(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය ;
(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(*ඈ*) නියම කරනු ලැබූ විට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(*ඉ*) කිසිදු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(*ඊ*) ඉල්ලුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

09. සම්මුඛ පරීක්ෂණ ශ්‍රී ලංකා ගුවන් හමුදා ඒකල කඳවුරේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණයන්ට සුදුසු යැයි සලකනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය පෞද්ගලිකව දන්වනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුව ද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් සේවයට බඳවා ගනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයින් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයින් තෝරාගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

12. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

13. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට පෙර හෙළදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

14. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් භටයින් සඳහා අයදුම්පත

01. සම්පූර්ණ නම : ———————.
(ජාතික හැඳුනුම්පතට අනුව)
02. ජාතික හැඳුනුම්පත් අංකය : ———————.
03. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය : ———————.
04. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) : ———————.
05. ස්ථිර ලිපිනය : ———————.
06. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය : ———————.
07. දිස්ත්‍රික්කය : ———————.
08. මැතිවරණ කොට්ඨාසය : ———————.
09. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ———————.
10. දුරකථන අංකය : ———————.
11. උපන් දිනය : ———————.
12. විවාහක/අවිවාහක බව : ———————.
13. උස : අඩි : ———————. අඟල් : ———————.
14. අ.පො.ස. (සා/පෙළ) විභාගය : —.

| අවුරුද්ද | විභාග අංකය | සමත්වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

15. අ.පො.ස. (උ/පෙළ) විභාගය : ——.

| අවුරුද්ද | විභාග අංකය | සමත්වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

16. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව, සහ පළපුරුද්ද ආදිය) : ———————.
17. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ඨතා පිළිබඳ විස්තර : ———————.
18. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී ලබා ඇති වෙනත් විශිෂ්ඨතා : ——.
19. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර : ———————.
20. සිවිල් හෝ යුද්ධ අධිකරණයේ දී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ———————.
21. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවි නාමය | ලිපිනය |
|---|---|---|
| | | |

22. ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

———————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ———————.

04-267

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව - නිලධාරි පුරප්පාඩු (නිත්‍ය/ස්වේච්ඡා)

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවන් හි ඉදුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

*(අ)* කාර්මික සංඥා ශාඛාව - (නිත්‍ය -පිරිමි)
*(ආ)* පරිපාලන රෙජිමේන්තු ශාඛාව - (නිත්‍ය- පිරිමි)
*(ඇ)* ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව - (නිත්‍ය- පිරිමි)
*(ඈ)* වෛද්‍ය ශාඛාව - (නිත්‍ය/ස්වේච්ඡා-පිරිමි/ගැහැණු)
*(ඉ)* දන්ත වෛද්‍ය ශාඛාව (නිත්‍ය/ස්වේච්ඡා - පිරිමි/ගැහැණු)
*(ඊ)* පරිපාලන වෛද්‍ය ශාඛාව - (නිත්‍ය/ස්වේච්ඡා - පිරිමි)
*(උ)* පාලන කෘෂි ශාඛාව - (නිත්‍ය- පිරිමි)
*(ඌ)* පරිපාලන අධ්‍යාපන ශාඛාව - (ස්වේච්ඡා - පිරිමි)

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන්/අපේක්ෂිකාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:-

*(අ) කාර්මික සංඥා ශාඛාව* :-
විද්‍යුත් හා විදුලි සංඥා ඉංජිනේරු නිලධාරි (ප්ලයිට් ලෙප්ටිනන්ට්/ප්ලයින් ඔෆිසර්/පයිලට් ඔෆිසර්):-
විද්‍යුත් හා විදුලි සංනිවේදන විද්‍යාවේදී උපාධියක් හෝ විද්‍යුත් හා විදුලි සංනිවේදන පිළිබඳව ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී.) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

*(ආ) පරිපාලන රෙජිමේන්තු ශාඛාව (තූර්‍ය වාදක නිලධාරි)*:

(1) තූර්‍ය වාදක නිලධාරි - (පයිලට් ඔෆිසර්)

*(අ)* එක් වතාවකදී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සංගීතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුලත්ව අවම වශයෙන් සම්මාන 04 ක් සහ සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම ; සහ

*(ආ)* ලන්ඩන් රාජකීය සංගීත විද්‍යාලයේ/ට්‍රිනිටි විද්‍යාලයේ 05 වන ශ්‍රේණිය දක්වා වූ හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබීම ;

*(ඇ)* තූර්‍ය වාදක කණ්ඩායම පුහුණු කිරීමේ හැකියාව සහ වාදක සමූහයක් විසින් වාදනය කල හැකි සේ සංගීත ප්‍රස්ථාරයන් සකස් කිරීමට ඇති හැකියාව අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ ;

*(ඈ)* පෙරදිග සහ අපරදිග සංස්කෘතික සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව මෙන්ම ස්වර ඥානය තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(2)නර්ථන කණ්ඩායම (පයිලට් ඔෆිසර්)

*(අ)* එක් වතාවකදී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සංගීතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුලත්ව අවම වශයෙන් සම්මාන 04 ක් සහ සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම ; සහ

*(ආ)* ශ්‍රී ලංකාවේ ලලිතකලා ආයතනයකදී ලබා ගත් නර්තන උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ ජාතික නැටුම් හා සංගීත (නර්තන) අවසාන විභාගය සමත් විය යුතුය ;

*(ඇ)* දේශීය හා විදේශීය නර්තන පිළිබඳ නව නිර්මාණ බිහිකිරීමේ හැකියාව තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ ;

*(ඈ)* දේශීය හා විදේශීය නව නර්තනයන් බිහිකිරීම හා පුහුණු කිරීමේ හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(3)පෙරදිග සංගීත කණ්ඩායම/බටහිර තූර්‍ය වාදක කණ්ඩායම (පයිලට් ඔෆිසර්)

*(අ)* එක් වතාවකදී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සංගීතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුලත්ව අවම වශයෙන් සම්මාන 04 ක් සහ සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම ; සහ

*(ආ)* ශ්‍රී ලංකාවේ ලලිත කලා ආයතනයකදී ලබා ගත් සෞන්දර්‍ය උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ ජාතික නැටුම් හා සංගීත විභාගයේ (සංගීත) අවසාන විභාගයේ හෝ ඉන්දියාවේ භාත්ඛණ්ඩ සංගීත පීඨයේ දෙවන පංතියේ විශාරද විභාගය සමත් විය යුතුයි ;

*(ඇ)* පෙරදිග සහ අපරදිග වාද්‍යයන් පුහුණු කිරීමේ හැකියාව අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ ;

*(ඈ)* පෙරදිග සහ අපරදිග සංස්කෘතික සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව මෙන්ම ස්වර ඥානය තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) *ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව* :-
සිවිල් ඉංජිනේරු නිලධාරී (ප්ලයිට් ලෙප්ටිනන්ට්/ප්ලයින් ඔෆිසර්/පයිලට් ඔෆිසර්)
සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් හෝ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී.) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබිය යුතු අතර පරිමාන මැනුම් ශිල්පය පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ඈ) *වෛද්‍ය ශාඛාව* :-
වෛද්‍ය නිලධාරී (ප්ලයිට් ලෙප්ටිනන්ට්) :
වෘත්තීය වෛද්‍යවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභා මණ්ඩලයේ පූර්ණකාලීනව ලියාපදිංචි වී තිබීම.

(ඉ) *දන්ත වෛද්‍ය ශාඛාව* :-
දන්ත වෛද්‍ය නිලධාරී (ප්ලයිට් ලෙප්ටිනන්ට්) :
පිළිගත් විශ්ව විද්‍යාලයක දන්ත වෛද්‍ය උපාධිය (බී. ඩී. එස්) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(ඊ) *පරිපාලන වෛද්‍ය ශාඛාව* :-
මනෝවෛද්‍ය නිලධාරී (ප්ලයිට් ලෙප්ටිනන්ට්) :
පිළිගත් විශ්ව විද්‍යාලයක මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් තිබීම.

(උ) *පාලන කෘෂි ශාඛාව* :-
කෘෂි නිලධාරී (පයිලට් ඔෆිසර්) :
පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් තිබීම.

(ඌ) *පාලන අධ්‍යාපන ශාඛාව* :-
ඉංග්‍රීසි භාෂා උපදේශක (ප්ලයිට් ලෙප්ටිනන්ට්/ප්ලයින් ඔෆිසර්/පයිලට් ඔෆිසර්)

පිළිගත් විශ්ව විද්‍යාලක ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය සහ ඉංග්‍රීසි භාෂාව සඳහා ඩිප්ලෝමාවක් හදාරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය සමග ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදාරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම සහ ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙක් ලෙස අවම වශයෙන් අවුරුද්දක පළපුරුද්දක් තිබීම; හෝ

අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ඕනෑම විෂයන් තුනකින් සාමාන්‍ය සමාර්ථ ලබා තිබීම සහ රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු අභ්‍යාස විද්‍යාලයක වසර දෙකක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීමෙන් පසු ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙක් ලෙස අවම වශයෙන් වසර තුනක සේවා කාලයක් ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම ;හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය සමග ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදාරා තිබීම හෝ අධ්‍යාපනවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම හෝ ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම සහ ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙක් ලෙස අවම වශයෙන් අවුරුද්දක පළපුරුද්දක් තිබීම; හෝ

අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ඕනෑම විෂයන් තුනකින් සාමාන්‍ය සමාර්ථ ලබා තිබීම සහ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක වසර තුනක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීමෙන් පසු ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙක් ලෙස අවම වශයෙන් වසරක සේවා කාලයක් ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

3. අනෙකුත් සුදුසුකම් :-

*(අ) පුරවැසි භාවය.*– ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය ;
*(ආ) උස.*– පිරිමි අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතුය. (වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරින් සඳහා අදාල නොවේ).
*(ඇ) පපුව.*– පිරිමි අඟල් 32 ට නොඅඩු විය යුතුයි ;
*(ඈ) වර්ණ දෘෂ්ටිය.*– සීපී 2 ;
*(ඉ) දෘෂ්ටි තීක්ෂණතාවය.*– : වම් ඇස 6/6 සහ දකුණ ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව)
*(ඊ) වයස.*–

(1) කාර්මික සංඥා ශාඛාව - 2007 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 28 නොවැඩි විය යුතුය ;
(2) පරිපාලන රෙජිමේන්තු ශාඛාව - 2007 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35 නොවැඩි විය යුතුයි ;
(3) ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව - 2007 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය :
(4) වෛද්‍ය ශාඛාව - 2007 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය :
(5) දන්ත වෛද්‍ය ශාඛාව - 2007 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය :
(6) පරිපාලන වෛද්‍ය ශාඛාව - 2007 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය :
(7) පාලන කෘෂි ශාඛාව - 2007 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය :
(8) පාලන අධ්‍යාපන ශාඛාව - 2007 ජුනි මස 30 වන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය :

4. යම් අයදුම්කරුවෙකුට වයස හෝ උස නියමිත සුදුසුකම් නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ප්ලයින් ඔෆිසර්/ප්ලයිට් ලෙෆ්ටිනන්ට් යන නිලයන් හි නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියට පත්කරනු ලැබේ.

8. *රාජ්‍ය භාෂා අවශ්‍යතා.-* තෝරා ගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූ ද ව්‍යවස්ථා පිලිපැදිය යුතුය.

9. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයකදී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසි වලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේය.

10. 1951 අප්‍රේල් මස 27 වන දින අංක10, 240 දරන *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වන වගන්තිය අනුව " සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක." කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේ නම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

11. ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

12. අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහභාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

13. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15 (ඇ) (15) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

14. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

15. (අ) වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ.

පයිලට් ඔෆිසර් - රු. 1,98,960 වසරකට
ෆ්ලයින් ඔෆසර් - රු. 2,75,220-30 x 7,740 = රු. 5,07,240 වසරකට
ෆ්ලයිට් ලෙෆ්ටිනන් - රු. 3,21,660 - 24 x 7,740 = රු. 5,07,420 වසරකට
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 3,52,620 - 20 x 7,740 = රු. 5,07,420 වසරකට
විංග් කමාන්ඩර් - රු. 3,62,100 - 15 x 9,480 = රු. 5,04,300 වසරකට
ගෲප් කැප්ටන් - රු. 4,41,060 - 17 x 12,600 = රු. 6,42,660 වසරකට

(ආ) වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

(1) වෛද්‍ය නිලධාරීන්
ප්‍රාථමික ශ්‍රේණිය - රු. 3,13,920 - 2 x 7,740 - රු. 3,29,400
2 වන ශ්‍රේණිය - රු. 3,37,140 - 8 x 7,800 - රු. 3,99,540
1 වන ශ්‍රේණිය - රු. 4,12,140 - 15 x 12,600 - රු. 601,140
විශේෂ ශ්‍රේණිය - රු. 5,08,680 - 12 x 15,720 - රු. 697,320

(2) දන්ත වෛද්‍ය නිලධාරීන් :
2 වන ශ්‍රේණිය - රු. 3,06,180 - 4 x 7,740 - 8 x 7,800 - රු. 399,540
1 වන ශ්‍රේණිය - රු. 4,12,140 - 16 x 12,600 - රු 6,01,140

(ඇ) අනෙකුත් දීමනා වෛද්‍ය හා දන්ත වෛද්‍ය ශාඛාවේ නිලධාරීන් සඳහා
(1) විශ්‍රාම හිමි වැටුප් දීමනා :
ප්‍රාථමික ශ්‍රේණිය - රු. 1,700 (මසකට)
ශ්‍රේණිය II - රු. 1,700 (මසකට)
ශ්‍රේණිය I - රු. 3,400 (මසකට)
විශේෂ ශ්‍රේණිය - රු. 3,400 (මසකට)

(2) විශ්‍රාම හිමි වැටුප් රහිත දීමනා :
ප්‍රාථමික ශ්‍රේණිය - රු. 2,125 (මසකට)
ශ්‍රේණිය II - රු. 1,700 (මසකට)
ශ්‍රේණිය I - රු. 400 (මසකට)

(3) අමතර රාජකාරි දීමනාව - රු. 5,000 (මසකට)

(4) අතිරේක රාජකාරි දීමනාව :
ප්‍රාථමික ශ්‍රේණිය - රු. 105 (පැයකට)
ශ්‍රේණිය II - රු. 140 (පැයකට)
ශ්‍රේණිය I - රු. 150 (පැයකට)

(5) (15) (ඇ) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාල පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඇ) අනෙකුත් දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 1,750 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට රු.2,400ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු.3,000 ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ.
(6) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255ක් ගෙවනු ලැබේ.
(7) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(8) ආහාර දීමනාව මසකට රු. 6,213.64 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(9) සුදුසුකම් වේතනය අදාල පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.
(10) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/නිලධාරිනියට, බිරිඳ/ස්වාමිපුරුෂා සහ දරුවන්ට) දෙනු ලැබේ.
(11) කඳවුර තුල වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරී නිවස්නයේ සිට තම නිවාසයට යෑමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.)
(12) නිල ඇඳුම් හා ඊට අදාල අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(13) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාල පරිදි)
(14) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30 ක් තුල රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(15) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ගෲප් කැප්ටන් සහ ඊට ඉහල නිලයන් සඳහා මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා.
(16) සේවා දීමනා මාසිකව රු. 300, රු. 400, 500 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි).
(17) අමතර සේවා දීමනා මසකට රු. 1,500 (වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි.)

16. විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියළුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස්* :

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියළුම කොටු හැකි පමණ විස්තරව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2007 මැයි මස 04 වන දින මධ්‍යාහ්න 12.00ට හෝ ඊට පෙර ලැබෙන සේ “ප්‍රධාන ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරී, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ” යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ “.........ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත” යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව හා මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

(ඇ) ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය :

(1) උප්පැන්න සහතිකය ;
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබා ගත් චරිත සහතික ;
(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික ;
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් සඳහන් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

*සැලකිය යුතුයි.*— මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේ දී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමිවීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

19. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය* :

(*අ*) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(*ආ*) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව හා දිනය, ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(*ඇ*) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

(*ඈ*) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(*ඉ*) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(*ඊ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ............... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.) :————.
2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව):————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ස්ථිර ලිපිනය :————.
5. තැපැල් ලිපිනය :————.
6. උපන් දිනය :————.
7. උස : අඩි :——— අඟල් :———.
8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
9. දිස්ත්‍රික්කය :————.
10. ඡන්ද කොට්ඨාසය :————.
11. ග්‍රාම සේවක කොට්ඨාසය :————.
12. දුරකථන අංකය :————.
13. විවාහක හෝ අවිවාහක බව :————.

14. පාසල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ/ විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව)* |
|---|---|---|---|
| | *අ.පො.ස. (සා. පෙළ)*<br>*අ.පො. ස. (උ. පෙළ)*<br>*වෘත්තීය සුදුසුකම්*<br>*වෙනත්* | | |

15. පාසලෙන්/විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :—.

| *සේවායෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

16. මව්පියන් පිළිබඳ විස්තර :

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැන් ලිපිනය* |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

17. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :———.
18. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.):———.
19. පාසැලේ දී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.
20. සන්නද්ධ සේවා හෝ ස්වෙච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.
21. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීන් පෙර ඉල්ලුම් කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :———.
22. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇප බැඳ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.
23. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකුව ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :———.
24. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

25. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :—.

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :——————.

04-268

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත දැක්වෙන වෘත්තීන්වල ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී.

1.(අ) *වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

*වෛද සහායිකා,*
*දන්ත සහායිකා.–* සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව (1999/2000 වසරවල අයදුම්කාරියක් නම් ගණිතය **II**, විද්‍යාව **II**) සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යා විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

*භෝජනාගාර භාරකරු .–* සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කාරියක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුළත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුළත් විය යුතුයි).

*අච්කරු .–* සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කාරියක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුළත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුළත් විය යුතුයි).

(ආ) *අනෙකුත් සුදුසුකම් :*

ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි :

*නිත්‍ය ගුවන් කාන්තාවන් සඳහා —*

1. *පුරවැසිභාවය.–* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
2. *වයස* :- 2007 ජුනි මස 30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වුද අවුරුදු 22 ට නොවැඩි අයෙකු විය යුතුයි.
3. *උස* :- අඩි 5 අඟල් 4 කට නොඅඩු විය යුතුයි.
4. බර :- ශරීර ස්කන්ධ දර්ශකය $\frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2} < 25$
5. *වර්ණ දෘෂ්ටිය* : CP 2
6. *දෘෂ්ටි තීක්ෂණතාවය* :- වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත).
7. *සිවිල් තත්ත්වය* :- අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවන තුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

02. පළමුවන ඡේදයේ "අ" හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පළමුවන ඡේදයේ "ආ" හි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස හා ඇස් පෙනීම නොමැති අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

03. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. *සේවා කොන්දේසි :*

(අ) ගුවන් කාන්තාවන්ට සේවයට බැඳුනු දා සිට ගුවන් හමුදා පනතට ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(ආ) තෝරා ගනු ලබන සියලුම වෘත්තීන්වල අදාළ ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුවත් ඉන්පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්වයන්හි වුවද ඕනෑම අකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකල යුතුයි.

05. *බඳවා ගැනීමේ කොන්දේසි :*

තෝරා ගනු ලබන අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ (දෙවන/තුන්වන පන්තියේ) ගුවන් කාන්තා ශ්‍රේණියට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 05ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 07ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතුයි. අවුරුදු 05 ක සේවය අවසන් වූ පසුව තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් කාන්තාවන්ට අවස්ථාව ඇත.

06. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් :*

තෝරා ගනු ලබන අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

07. *වැටුප් හා දීමනා :*

(*අ*) වසරකට ගුවන් කාන්තාවන්ට අදාළ ඒකාබද්ධ වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ.
ගුවන් කාන්තා - රු. 1,66,560 - 7 x 1,440 - 10 x 1,800= රු. 1,94,640
නායක ගුවන් කාන්තා - රු. 1,70,880 - 4 x 1,440 - 11 x 1,800 = රු. 1,96,440
කෝප්‍රල් - රු. 175200 - 1 x 1,440 - 13 x 1,800 = රු. 2,00,040
සැරයන් - රු. 178440 - 10 x 1,800 - 2 x 2,520 - 1 x 3,480 = රු. 2,04,960
බලපත්‍රි සැරයන් - රු. 1,82040 - 8 x 1,800 - 2 x 2,520 - 3 x 3,480 = රු. 2,11,920
බලලත් නිලධාරී - රු. 1,89,240 - 4 x 1,800 - 2 x 2,520 - 9 x 3,480 = රු. 2,32,800

ඉහත දැක්වෙන පරිදි වාර්ෂික ඒකාබද්ද වැටුප් පරිමාණයන්ට අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. සේවා කාලය, යහපත් කල්ක්‍රියාව සහ කාර්යක්ෂමතාව මත ඉදිරි නිලයන් පිරිනමනු ලබන අතර, ඒ අනුව නියමිත වැටුප් දර්ශකයන්හි පිහිටවනු ලැබේ.

(*ආ*) *දීමනා :*

1. ජීවනාධාර දීමනාව මසකට රු. 1,750 ක් ගෙවනු ලැබේ.
2. දුෂ්කර දීමනා මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.
3. ක්‍රියාත්විත සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 1,900 ක් ගෙවනු ලැබේ.
4. විශේෂ දීමනාව මසකට රු. 2,400ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 80 බැගින්)
5. *දිරි දීමනා.* - සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට රු. 250 සිට 850 දක්වා).
6. *ආහාර දීමනා .*- පිටත වාසය කරන ගුවන් කාන්තාවන්ට මසකට රු. 5,649.75 බැගින් ගෙවනු ලබන අතර, කඳවුරු තුළ වාසය කරන ගුවන් කාන්තාවන්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.
7. *නේවාසික පහසුකම් .*- කඳවුරු තුළ වාසය කරන ගුවන් කාන්තාවන්ට නොමිලේ සපයනු ලැබේ.
8. *ගමනාගමනය .*- වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් කාන්තාව/ස්වාමිපුරුෂයා/ළමයින්ට) ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.
9. *වික්ෂේපණ දීමනා .*- මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)
10. *සුදුසුකම් වැටුප් .*- ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50)
11. *යහපත් කල්ක්‍රියා ලාඡන දීමනා .*- මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තියන්ටය. (මසකට රු. 30 සිට රු. 204 දක්වා).
12. *නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව .*- මසකට රු. 170 ක් ගෙවනු ලැබේ.
13. *නැවත සේවයට බැඳීමේ වැටුප් .*- නැවත සේවයට බැඳෙන ගුවන් කාන්තාවන්ට මසකට රු. 300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.
14. *වෛද්‍ය පහසුකම් .*- ගුවන් හමුදාව මඟින් සෑම ගුවන් කාන්තාවකටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර, විවාහක නම් ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.
15. කඳවුරුවල සිට සැතපුම් 30 ක (කි. මී. 48ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මඟින් නොමිලේ ගමන් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.
16. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන් කාන්තාවන්ට මසකට රු. 1,200 සිට රු. 3,300 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.
17. *උපදේශක දීමනාව .*- මසකට රු. 425 සිට රු. 510 දක්වා දීමනාවක් හිමි වේ.
18. *වෙනත් දීමනා .*- (වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.
19. වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත් දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන් කාන්තාවන් දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

08. *ඉල්ලුම්කාරියට උපදෙස් :*

*(අ)* පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2007 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00 ට පෙර ලැබෙන සේ " ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකළ, කොටුගොඩ " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන ඉල්ලුම්පත් බාර ගනු නොලැබේ.) අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ " ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත " යනුවෙන් සඳහන් කළ යුතුයි. එක් අයදුම්කාරියක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම්කළ යුතු අතර වෘත්තීන් කීපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකල, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර වෙත ලැබුණා වූ ද මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ද ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*(ආ)* රජයේ සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිතර වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/ සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තව ද යම් හෙයකින් එම ඉල්ලුම්කාරිය තෝරාගනු ලැබුවහොත් ඇය මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතුයි.

*(ඇ)* සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂිකාවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික.

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව සහ හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්. මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කාරිය ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(5) ක්‍රීඩා, ශිෂ්‍ය භට යනාදිය පිළිබඳ සහතික.

*(ඈ)* නියම කරනු ලැබූ විට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කාරියන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

*(ඉ)* කිසිදු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

*(ඊ)* ඉල්ලුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වග කියනු නොලැබේ.

09. සම්මුඛ පරීක්ෂණ ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල කඳවුරේදී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණයන්ට සුදුසු යැයි සලකනු ලබන අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය සහ වේලාව සහ ස්ථානය පෞද්ගලිකව දන්වනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම ඇයගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කාරියන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුව ද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු වල අගය අනුව අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂිකාවන් තෝරාගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහළ මට්ටමේ සිටයි.

12. අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඇයට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඇයගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

13. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂිකාව තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

14. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්
ගුවන් හමුදාපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594
කොළඹ.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් කාන්තාවන් සඳහා අයදුම්පත

01. සම්පූර්ණ නම :————.
(ජාතික හැඳුනුම්පතට අනුව)
02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
03. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :————.
04. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :————.
05. ස්ථිර ලිපිනය :————.
06. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
07. දිස්ත්‍රික්කය :————.
08. මැතිවරණ කොට්ඨාසය :————.
09. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.
10. දුරකථන අංකය :————.
11. උපන් දිනය :————.
12. විවාහක/අවිවාහක බව :————.
13. උස : අඩි :————, අඟල් :————.
14. අ. පො. ස. (සා/පෙළ) විභාගය :

| *අවුරුද්ද* | *විභාග අංකය* | *සමත්වූ විෂයයන්* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

15. අ. පො. ස. (උ/පෙළ) විභාගය :

| *අවුරුද්ද* | *විභාග අංකය* | *සමත්වූ විෂයන්* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

16. තනතුර සඳහා විශේෂ සුදුසුකම් : (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ආදිය) :————.
17. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ටතා පිළිබඳ විස්තර :————.
18. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී ලබා ඇති වෙනත් විශිෂ්ටතා :————.
19. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.
20. සිවිල් හෝ යුද්ධ අධිකරණයේ දී වැරදිකරු වී ඇති හෝ ඇප බැඳ හෝ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.
21. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවි නාමය* | *ලිපිනය* |
|---|---|---|
| | | |

22. ඉල්ලුම්කාරිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කාරියගේ අත්සන.

දිනය : ————.

04-269
B2–B 079479

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය

### ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2007/2008

මොරටුව විශ්ව විද්‍යාලයට අයත් තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, මොරටුව විශ්ව විද්‍යාලයීය තාක්ෂණික ආයතනය නව පරිශ්‍රයක ස්ථාපනය කරන තෙක් මොරටුව විශ්ව විද්‍යාලයීය පරිශ්‍රය තුළ පැවැත්වෙනු ඇත.

1. *සාමාන්‍ය :*

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ :

(i) රසායන ඉංජිනේරු තාක්ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය
(v) නාවුක ඉංජිනේරු තාක්ෂණය
(vi) යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය
(vii) නෞකා චාලන අධ්‍යයන හා තාක්ෂණය
(viii) පොලිමර් තාක්ෂණය
(ix) පේෂකර්ම හා ඇහලුම් තාක්ෂණය

2. *යෝග්‍යතාවය :*

2.1 *වයස :*

(අ) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 නොඉක්ම විය යුතුය.

(ආ) නෞකා චාලන අධ්‍යයන තාක්ෂණය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී වයස අවුරුදු 20 ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්ව විද්‍යාලයක (විවෘත විශ්ව විද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණ කාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණ කාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නො ලබයි.

2.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2004 හෝ 2005 හෝ 2006 වසරේ පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී එක වර පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් සමත්විය යුතුය.

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

3. *තෝරා ගැනීමේ පදනම/ක්‍රියාපටිපාටිය :*

3.1 *පාඨමාලාවට ඇතුළත් කර ගැනීම :*

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ. පො. ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණයේ සාමාර්ථය මත සිදු කරනු ලැබේ.

යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ. පො. ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත සිසුන් තෝරාගනු ලැබේ. (Z ලකුණු මත). 40% ක් අ.පො.ස.(උ.පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60% ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

3.2 *අධ්‍යයන ක්ෂේත්‍රය* :

යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙළ, අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

4. *අයදුම් කිරීමේ පිළිවෙළ :*

4.1 *අයදුම්පත් පෝරම හා විස්තර :*

(a) මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයෙන් නිකුත් කරනු ලබන අයදුම්පත භාවිතා කිරීම අනිවාර්යය වේ.

(b) ලිපිනය ලියූ මුද්දර ඇල වූ ලියුම් කවරයක් 9" x 4" (රු. 30 වටිනා මුද්දරයක් අලවන්න.) ඉහළ වම්පස කෙළවරේ "ජාතික තාක්ෂණික ඩිප්ලෝමා අයදුම්පත - 2007/2008" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. "සහකාර ලේඛකාධිකාරී, මොරටුව විශ්ව විද්‍යාලයීය තාක්ෂණික ආයතනය, මොරටුව විශ්ව විද්‍යාලය, කටුබැද්ද, මොරටුව"

(c) ආදර්ශ අයදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

http://www.mrt.ac.lk/itum

පහත දැක්වෙන ලියකියවිලි වල සහතික කළ *පිටපත්*, සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

අ.පො.ස.(උ.පෙළ)සහතිකය
අ.පො.ස.(උ.පෙළ) Z ලකුනු සඳහන් සහතිකය
පාසල් හැර යාමේ සහතිකය
උප්පැන්න සහතිකය
ජාතික හැඳුනුම්පත
සහතික, ලියකියවිලිවල සඳහන් නමේ වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්

(i) ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුලත් වීම - 2007/2008" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. "අධ්‍යක්ෂ, මොරටුව විශ්ව විද්‍යාලයීය තාක්ෂණික ආයතනය, මොරටු විශ්ව විද්‍යාලය, කටුබැද්ද, මොරටුව".

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දින හෝ ඊට පෙර ලැබෙන සේ අයදුම්පත සහ අදාළ ලියකියවිලි එවිය යුතුය.

(iii) නාවුක අධ්‍යයන ක්ෂේත්‍රයන් (SET 1) හෝ අනිකුත් ක්ෂේත්‍රයන් (SET 2) හෝ ක්ෂේත්‍රයන් දෙකම එනම් (SET 1) හා (SET 2) යන කොටස් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. එසේ කොටස් දෙකම සඳහා අයදුම්කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතුය.

4.2 *ඉල්ලුම් පත්‍ර ගාස්තු* :

ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් ඉහත 4.1 (iii) හි සඳහන් පරිදි SET 1 හා SET 2 යන කොටස් දෙකම ඉල්ලුම් කරන්නේ නම් රු. 400 (හාරසීයක්) ක්ද, SET 1 හෝ SET 2 දෙකෙන් එකක් පමණක් ඉල්ලුම් කරන්නේ නම් රු. 200 (දෙසීයක්) ක්ද ගෙවිය යුතුය. එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් "මොරටුව විශ්ව විද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ, කටුබැද්ද ශාඛාවේ, ගිණුම් අංක 308280" දරන ගිණුමට බැර කළ යුතුය. මෙම අයදුම්පත් ගාස්තු මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

4.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2007 ජූනි මස 08 වැනි දින වේ.

5. *යෝග්‍යතා පරීක්ෂණය* :

අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල මත එක් එක් දිස්ත්‍රික්කයට අදාළව මෙම ආයතනය විසින් පිළියෙළ කරනු ලබන ලඝු කළ ලැයිස්තුවේ සිසුන් ප්‍රමාණය පමණක් යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. යථෝක්ත යෝග්‍යතා පරීක්ෂණය ද මෙම තාක්ෂණික ආයතනය විසින් පවත්වනු ලැබේ.

6. *පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම* :

(i) තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දිනම, පහත සඳහන් සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

* අ.පො.ස. (උ.පෙළ) සහතිකය
* අ.පො.ස.(උ.පෙළ) Z ලකුණු සඳහන් සහතිකය
* පාසැල් හැර යාමේ සහතිකය
* උප්පැන්න සහතිකය

*ඉතා වැදගත් :*

(ii) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදැරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළදී, මෙම විශ්ව විද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්ව විද්‍යාලයක පාඨමාලාවක් හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදැරීමට සුදුසුකම් නොලබයි. (විවෘත විශ්ව විද්‍යාලය හැර)

(iii) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදැරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්ව විද්‍යාලයක (විවෘත විශ්ව විද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණ කාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නො ලබයි.

අධ්‍යක්ෂ,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය,

2007 මාර්තු මස 29 දින
මොරටුව විශ්ව විද්‍යාලය,
කටුබැද්ද,
මොරටුව.

04-265

---

## සමෘද්ධි සංවර්ධන නිලධාරී I/II වන ශ්‍රේණිය සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2006

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි සංවර්ධන නිලධාරී I වන හා II වන ශ්‍රේණිවල නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් දිවයිනේ දිස්ත්‍රික්ක වල ප්‍රධාන නගරයන්හිදී ජූනි මාසයේදී පවත්වනු ලැබේ.

ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් කිසියම් නගරයක් ඉල්ලා නොමැති විට ඊට ආසන්න නගරය වෙත ඔවුන් යොමු කරනු ලැබේ.

02. විභාග පරිපාටිය හා විෂයය නිර්දේශය :

මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

1. ආයතන හා ගිණුම් ක්‍රියාවලිය පැය 02කි.
2. සමෘද්ධි ව්‍යාපාරය හා සම්බන්ධ දැනුම පැය 02කි.

සටහන.–

(අ) සියලුම විෂයයන් සඳහා එකම වාරයකදී හෝ වාර කීපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

(ආ) ප්‍රශ්න පත්‍රයට ලකුණු 100ක් දෙනු ලබන අතර, සාමාර්ථය සඳහා I වැනි ශ්‍රේණියේ නිලධාරීන් සෑම ප්‍රශ්ණ පත්‍රයකින්ම ලකුණු 40%ක් හෝ ඊට වැඩි ගණනක් ලබා ගත යුතු අතර, සාමාර්ථය සඳහා II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සෑම ප්‍රශ්ණ පත්‍රයකින්ම ලකුණු 35%ක් හෝ ඊට වැඩි ගණනක් ලබාගත යුතුය. මෙම විභාගයේ දී සෑම ප්‍රශ්න පත්‍රයකින්ම 40%ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා II වැනි ශ්‍රේණියේ නිලධාරියෙකු පසු කාලීනව I වැනි ශ්‍රේණියේ පත්වීමක් ලැබුවහොත් ඔහු මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඇ) ඉහත පළමුවන ප්‍රශ්න පත්‍රය කොටස් 2කින් සමන්විත වේ. අයදුම්කරුවන් මෙම කොටස් දෙකටම වෙන වෙනම පිළිතුරු සැපයිය යුතුය.

03. *විෂය නිර්දේශය* :

(අ) ආයතන හා ගිනුම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම :

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. පළමු කොටස බහුවරණ හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වන අතර, මෙම කොටසෙහි සෑම ප්‍රශ්නයකටම අනිවාර්යයෙන් ම පිළිතුරු සැපයිය යුතු වේ. (ලකුණු 60කි) දෙවන කොටස රචනා හෝ ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න හතරකින් යුක්ත වන අතර, තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 40කි).

ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත කාලය පැය දෙකකි. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි සංග්‍රහය ආශ්‍රයෙන් පහත සඳහන් කරුණු පදනම් කොට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

(i) සේවකයින් පත් කිරීමට අදාළ කොන්දේසි
(ii) සේවකයින් මාරු කිරීම්, උසස් කිරීමේ හා විශ්‍රාම ගැන්වීමේ පරිපාටි
(iii) නිවාඩු
(iv) වැටුප් වර්ධක
(v) කාර්යක්ෂමතා කඩඉම්
(vi) ගමන් වියදම් ගෙවීම
(vii) රාජකාරි ලැයිස්තු
(viii) රාජකාරි දින පොත්
(ix) ඉදිරි වැඩසටහන්
(x) කාර්යාල කළමනාකරණය
(xi) මහජන සබඳතා පැවැත්වීම හා සන්නිවේදනය
(xii) වෘත්තීය සමිති හා දේශපාලන අයිතිවාසිකම්
(xiii) ගෙවීම් ක්‍රියාවලිය
(xiv) මූල්‍ය බලතල පැවරීම
(xv) ටෙන්ඩර් ක්‍රියා පරිපාටිය
(xvi) ගනුදෙනු සටහන් කිරීම
(xvii) ඉන්වෙන්ට්‍රි පාලනය
(xviii) භාණ්ඩ තොග සමීක්ෂණ කටයුතු
(xix) බැංකු ගිනුම් පවත්වාගෙන යාම
(xx) විගණන ක්‍රියාවලිය
(xxi) හානි සම්බන්ධ කටයුතු කිරීම
(xxii) මහජන මුදල් පරිහරණය
(xxiii) රාජ්‍ය දේපල ආරක්ෂා කිරීම
(xxiv) කොන්ත්‍රාත් කටයුතු
(xxv) සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල
(xxvi) අර්ථ සාධක අරමුදල

(ආ) සමෘද්ධි ව්‍යාපාරය හා සම්බන්ධ විෂයය දැනුම

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. පළමු කොටස අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතු බහුවරණ/කෙටි ප්‍රශ්නවලින් යුක්ත වේ. ලකුණු ප්‍රමාණය 60කි. දෙවැනි කොටස ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වන අතර, විෂයානුබද්ධ අධ්‍යයන ස්වරූපයෙන් (case study) ප්‍රශ්නයක් ද ඇතුළත් වේ. අපේක්ෂකයන්ට තෝරා ගැනීමට හැකිවන අන්දමින් ප්‍රශ්න කිහිපයක් මෙම කොටසට ඇතුළත් වන අතර,ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුවේ. මෙම කොටස සඳහා හිමි ලකුණු ප්‍රමාණය 40කි.

ප්‍රශ්න පත්‍රය සහා නියමිත කාලය පැය දෙකකි.

1. දිළිඳුකම පිටුදැකීම

2. සමෘද්ධි ව්‍යාපාරයේ නව ගමන් මග

   දැක්ම
   මෙහෙවර
   අභිමතාර්ථ
   දිළිඳුකම පිටුදැකීමේ විවිධ මට්ටම් සඳහා සැලසුම්
   පවුල් සංවර්ධන සැලැස්ම
   කාර්ය සාධන ඇගයීම
   නිර්දේශපාලනීකරණය

3. සමෘද්ධි ව්‍යාපාරය යටතේ ප්‍රජා සංවිධාන ගොඩ නැඟීම

   සමෘද්ධි බලකාය
   කුඩා කණ්ඩායම්
   සමෘද්ධි සමිති
   සමෘද්ධි බැංකු සංගමය
   සමෘද්ධි මහා සංගමය

4. සමාජ සජීවීකරණ ක්‍රියාවලිය

5. සහභාගිත්වය සංවර්ධන ප්‍රජා ව්‍යාපෘති හා ග්‍රාම සංවර්ධනය
6. බැංකු මූල්‍ය කටයුතු
7. විවිධ ණය වැඩසටහන්
8. සමාජ ආරක්ෂණ වැඩසටහන
9. සමාජ සංවර්ධන වැඩසටහන
10. ආදායම් උත්පාදන වැඩසටහන

කෘෂිකර්ම
සත්ත්ව නිෂ්පාදන හා ධීවර
කර්මාන්ත
අලෙවි

11. සරල ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම
12. ප්‍රගති පාලනය
13. සහනාධාර වැඩසටහන
14. ශ්‍රී ලංකාවේ සංවර්ධන අත්දැකීම්
15. සැලසුම්කරණයේ මූලධර්ම

04. මෙම පරීක්ෂණය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. පරීක්ෂණය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් විසින් අයදුම්පත් පිළියෙල කර ගත යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුත්තේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පමණි. අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.

05. අයදුම්පත්‍රය තම ප්‍රධානියා මගින් හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට අනුයුක්තවන්නේ නම් එහි ප්‍රාදේශීය ලේකම් මගින් හෝ 2007 මැයි මස 10 දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන විභාගයේ නම් සඳහන් කළ යුතුය. විභාගය සඳහා වූ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තම අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය අනුව පිළියෙල කර ගත හැකිය. අයදුම්පතේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

06. යම් අපේක්ෂකයකුට විභාගයට යටත් පිරිසෙයින් දින හතකටවත් කලින් තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත්, ඔහු විසින් ඒ බව අප්‍රමාදව පහත දැක්වෙන තොරතුරු සමග බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම් දිය යුතුය. විදුලි පණිවිඩ යවන ලිපිනය "විභාග බත්තරමුල්ල" :

1. විභාගයේ නම;
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම;
3. අයදුම්කරුගේ ලිපිනය;
4. ඉල්ලුම්පත්‍රය තැපැල් කළ කාර්යාලය;
5. ලියාපදිංචි අංකය හා දිනය.

07. *අනන්‍යතාව.*– අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තම අනන්‍යතාව තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුයි.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය;
2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

08. *විභාග ගාස්තු* - මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත පදනම මත ගාස්තු අය කෙරේ :

| | *විභාග ගාස්තු* | *රු. ශ'* |
|---|---|---|
| (අ) | පළමුවතාව සඳහා ගාස්තු අය නොකෙරේ | - |
| (ආ) | පළමු වතාවෙන් පසු සම්පූර්ණ විභාගය සඳහා | 250 0 |
| (ඇ) | එක් විෂයක් සඳහා | 125 0 |

විභාග කොමසාරිස් ජනරාල්ගේ අංක 4,000 - 20-03-20-13 දරන ආදායම් ශීර්ෂයට බැර වනසේ දිවයිනේ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් මුදල් කුවිතාන්සියක් නොගැලවෙන සේ අයදුම්පතේ අලවා එවිය යුතුය.

09. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් කෙරේ.

10. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති, තමන්ගේ දෙපාර්තමේන්තු/ කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තුව/කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය.

11. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත්, ඒ පිළිබඳ ව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ලැබේ.

රවීන්ද්‍ර හේවාවිතාරණ,
අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,
04 වෙනි මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

## උපලේඛනය 1

### දිස්ත්‍රික් නාමලේඛනය හා අංක

| *දිස්ත්‍රික්කය* | *අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| වවුනියා | 13 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| පොලොන්නරුව | 20 |
| බදුල්ල | 21 |
| මොණරාගල | 22 |
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චි | 25 |

විභාග අංකය

**සමෘද්ධි සංවර්ධන නිලධාරී I/II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2006**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

| අයත් ශ්‍රේණි | | |
|---|---|---|
| | 1 | |
| | 11 | |

අදාළ කොටුවේ " ✓ " යොදන්න

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |

විභාගයට පෙනී සිටින මාධ්‍යය
සිංහල-2 දෙමළ -3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න)

1.0 නම :

1.1 මුලකුරු සමග නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා - SILVA A. B.

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම්:—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම:—————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 රාජකාරි ලිපිනය :—————.
(ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය
ස්ත්‍රි 1, පුරුෂ 0

☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : විවාහකයි -1 අවිවාහකයි -2

☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය : වර්ෂය: ☐☐☐☐ මාසය : ☐☐ දිනය: ☐☐

4.0 මෙම විභාගයට ඉදිරිපත් වන විෂයයන් :
ආයතන හා ගිණුම් ක්‍රියාවලිය - 1
සමෘද්ධි ව්‍යාපාරය හා සම්බන්ධ දැනුම - 2
විෂයයන් දෙකම - 3

☐

අදාළ අංකය කොටුව තුළ යොදන්න.

5.0 පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු : රු.:—————.
සම්පූර්ණ විභාගය සඳහා රු. 250 කි. එක් එක් විෂයයක් සඳහා නම් රු. 125කි.

| කුවිතාන්සිය ඇලවීම සඳහා |
|---|

6.0 දැනට දරන තනතුර හා ශ්‍රේණිය :—————.

ඉහත දැක්වෙන තොරතුරු නිවැරදි බවත්, ඉල්ලුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

——————.
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :——————.

විභාග කොමසාරිස් ජනරාල්.
ඉදිරිපත් කරමි.

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

——————.
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය)

දිනය:——————.

04-286

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.